




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

අපට කියවන්නට ලැබෙන ඇතැම් කවි කිසියම් ඒකායන නිශ්චිත අරමුණක් වෙත ඇදීයමින් පිලිවෙලකට ලියැවෙන අතර තවත් සමහර කවියක් එහි මූලික අරමුණ යම්තාක් දුරට පැහැදිලි වූවද ගලේ කෙටුවාක් වැනි තනි අවසානයක් වෙනුවෙන් නියෝජනය නොවී, ඒ තුළම කැටිවූ සංදිග්ධ අරථයන් හමුවේ අහඹු හැඟීම් බහුල විසිරුණු වින්දන පථයක් අපට උරුම කර දේ. එවන් කවි කුමන මාතෘකාවක් යටතේ පෙළ ගැස්සුවද විඳින්නා තුළ ඇති කරන්නේ විවිධ වූ පැතිරුණු විහිදුණු අර්ථ සමූහයකි. ඒ අතින් ගත් කළ 'නික්මයාම' ලෙස නම් කර ඇති මාලතී කල්පනා ගේ ඉහත කවියත් මා මනසේ ජනිත කළේ එවන් පැතිරුණු හැඟීම් සමුදායකි. එය හොඳක් හෝ නරකක් ලෙස දකිනවාට වඩා විවිධ කවිවලට ගත හැකි එවන් විවිධ වූ මුහුණුවලට හිමි අනන්‍ය රම්‍යතාවන් හුවා දැක්වීම වඩා යෝග්‍ය යැයි හඟිමි. එවන් කවි පදානුපදිකව අර්ථ ගැන්වීමට යාම බොහෝ විට නිෂ්ඵල දෙයක් යැයි මට හැඟේ. ඒ වෙනුවට සොයා පාදා ගත හැකි හැම තැනින්ම සියුම් වින්දනාර්ථයන් මතුකරගෙන එවන් හැඟීම් මාලාවක ගිලී කිමිදී යාම වඩා යෝග්‍ය යැයි සිතේ. මෙලෙස වෙනස් වෙනස් ආකාරයෙන් විවිධ මුහුණුවලින් පෙනීසිටීමම කවියකට හිමි සුන්දරතාව නොවේදැයි අප විසින් තේරුම් ගත යුතු නොවේද?

නික්මයාමක පෙරනිමිති බඳු කිසියම් වේදනාත්මක වෙන්වීමක කැටිවූ සොඳුරු මතකයන් හා බැඳුණු වර්ථමාන නිමේශයන් ගැන සියුම් සංඥා කිහිපයක් පළමු කවියෙන්ම දිග හැරේ. කිවිඳිය සංකේතාර්ථයන් ඔස්සේ ඒ වෙන්වයාම හා මුහුවුණු අංශුමාත්‍රීය මොහොතවල් අපට පෙනෙන්නට සලස්වයි. ඒ පුංචි පුංචි සෑම දෙයක්ම ඉහත කී නික්මයාම හා ඉතාම අවියෝජනීයව බැඳුණු වේදනාබර සංසිද්ධීන් වේ. 'නික්මයාම' ලෙස නම් කළද මේ කවිය තුළම එකතුවීමත් කැටිවී තිබීම මෙහි අපූර්වත්වය වඩාත් තීව්‍ර කරන්නකි. අපේ ජීවිතවලින් කෙනෙකු නික්මයන විට තවත්

## නික්මයාම

**වෙන්ව යන බැව් ඉඟි කළ රහස් විදිහක
දවා අත්හළ අවසාන කවියක
මිටින් හළ බොහෝ දෑ
අවර්ණව මැකී යන මොහොතක
ඔබ සෙමෙන් පැතිරෙයි
දම් පැහැ අහස් සැණකෙළියක**

**සෘතු එන යන
සමහරු
නො එන්නම නික්මෙන
තවත් අය
නැවිත් ම ළඟ හිඳින**

**ළබැඳියන් නික්ම යන විට
හැර තබයි අලුත් දොර කවුළු
කැමති නම් එබී බැලුමට
කැමති නම් මඳක් දුර ගොස් හැරී ඒමට
ආදරේ නම්,
දිගට පිය මැන
ඒ අය මුණගැහෙන්නට**

**ඒ ඉවුරු කෙබඳු ද?
මේ නදිය මෙන් ම කලබලද?
හමුවිය යුතු අය සිටියි
ඔතැන
මග බලාගෙන**

**හිතුන විට
එතෙර විය නො හැකිය අපට
දමා ආ නො හැකි අය වැරෙන් අත
අල්ලගෙන**

**අන්තිමේදී,
තෝරා ගැනීමක් ය
හැම විට ම**

**හුස්මකින් දෙකකින්
දිගු කලක් වසන්නට
බැරි විටෙක
හුස්ම හිර වෙනතුරු
අඬන්නට**

**......**

**එතෙරත් මෙතෙරත්
අතර මැද නදියක
එතෙර විය යුතු බව අමතක
එහෙයිනි මේ කලබල**

**මාලතී කල්පනා ඇම්බ්‍රෝස්**
'ඔබ ගැඹුරු නින්දක' කාව්‍ය සංග්‍රහය - 2016

කෙනෙකුගේ ජීවිතයක හිඩැසක් පිරවී එක් තැනක වේදනාව ඒ මොහොතේම තවත් තැනක සන්තුෂ්ටියක් බවට පත්වේ. විටෙක වේදනාවක් ලෙස ඇරඹුණද තවත් විටෙක එහි විලෝමය ලෙසින් ජීවිතයකට විවිධ අර්ථයන් හා සතුට ළඟා වන්නේද අප නොසිතන ආකරයට අහම්බයක මුහුණුවරිනි. තමා වෙතින් නික්මයන ළබැඳියකු ගැන අනුවේදනීය බසකින් කියන මේ කවිය කිවිඳියගේ අභ්‍යන්තරය විනිවිද දැකීමට අපට වඩාත් ඉඩ සලසන්නේ ඒ වේදනාවම තවෙකෙකුගේ සතුට වෙනුවෙන් ඉවසා දරා බාරගෙන හිතා හදා ගැනීමට ඈ දරන තැත තුළය. වේදනාවක් වුවද ඒ ඇයට නිරාමිස සතුටක් වැන්න.

පළමු කවියෙන් හුවා දක්වන වෙන්වීම සංකේතවත්



කිරීමට ඈ සියුම් සංඥාර්ථයන් කිහිපයක් යොදා ගනී. වෙන්වන්න පෙර, වෙන්වන බව නොකී යා කියූ ඉඟි-බිඟි, හිතේ දුකටම දවා හළු කළ පෙරදාක ස්නේහයෙන් හුවමාරු කරගත් පැරණි කවිපද ඇතුළු කාලයක් තිස්සේ ආදරය කරමින් රැකගත් තවත් බොහෝ දෑ ත් මිටින් අත් හැරි බව ඒ නික්මයාම සනිටුහන් කරයි. ඒ නම් ඉතා වේදනාබර රමණීය බසකි. ඒ මතක සැමරුම් නිවී යන්නේ වර්ණයක් රහිතවය. එය ඈ පෙළෙන දුකම තීව්‍ර කරන අතර ඊට සමගාමීව ඇගෙන් වෙන්ව යන ප්‍රියයාණන් ඉතාමත් වර්ණවත් වූ දම් පැහැ අහස් සැණකෙළියක සෙමෙන් පැතිරී යන්නේ ලෝකයේ එහා කොණක මේ දුක තුළින්ම මතුවූ සතුටක් හුවා දක්වමිනි. මේ දම් පාට අහස විදෙස් රටක සරත් සෘතුවක අහසක් මා සිතේ මවන අතර ඇගෙන් නික්මී යන හෙතෙම සමුදුරෙන් එතෙර, ජීවිතය අන් තැනක සොයන්නට ගොස් ඇති බව ඉන් නොකියා කියැවෙයි.

අනතුරුව ඈ ඔහු යන්න ගිය පරිසරයෙන්ම සෘතු වෙනස්වීම් වැනි සංකල්පයන් උකහා ගෙන ඊට අනුගතව මේ දැනුණ දුක සමනය කරගන්න, හිතා හදා ගන්න වෙහෙසෙන්නීය. ඈ ඒ ඔස්සේ විවිධ දෑ උපකල්පනය කරන්නේ පෑරුණු හිත බිඳක් හෝ සමහන් කරගන්නටය. සෘතුවකට පසු තවත් අලුත් සෘතුවක් එළැඹෙන්නේද අපේ ජීවිත පරිද්දෙන්මය. යම් දෙයක් නැතිව යනවිට අලුත් දෙයක් ජීවිතයට එකතුවී ඊට වඩා වෙනස් අර්ථයන් අපේ ජීවිත මත සපුරන්නේ නොවේද? මෙලෙස සෘතු යන එනවා සේම අපේ හිත ගත් සමහරු අපේ ජීවිතවලින් නොඑන්නම නික්ම යති. තවත් සමහරෙක් අපේ ජීවිතවලට කිසිදා ශාරීරික වශයෙන් ළං නොවුණද දුර ඉඳන් ඉතා ළංව හිඳිති. ඔවුහු කිසිදා අප වෙත නාවද සදාකාලිකව අපේ සිත් සතන් ඇතුළේ ලැගුම් ගෙන නිසලව නිහඬව හිඳිති. මුලින් කිවුවා සේම නිෂ්චිතම නික්මයාමක් සටහන් නොකරන මේ කවිය මෙවන් වූ විසිරුණු හැඟීම් මාත්‍රයන් කැටිකරමින් වෙන්වීම හෝ හමුවීම හමුවේ මානව චිත්තභ්‍යාන්තරය ක්‍රියාකරන, කිසිදා උපකල්පනය කළ නොහැකි කැළඹිලි සහිත ස්වරූපය එනම් අහඹු ආකාරය අපට විඳගන්න ඉඩ හරින්නේ ඉතාමත් හෘදයාංගමව ඒ සමග අපටත් අනුගත වන්නට කාල අවකාශ තනමිනි.

ඈට අනුව මේ ළැබැඳියෝ අපේ ජීවිතවලින් නික්ම යන විට අපේ ජීවිත මත මෙන්ම අනෙකෙකුගේ ජීවිත මතද අලුත් දොර කවුළු කිහිපයක්ම හැර තබා යති. නික්මයාමම නික්මයාමක් ලෙස පිළිගන්නට ඈ සිත තවමත් සූදානම් නැති නමුදු ඈට අනුව එක් කවුළුවකින් තම සිත ගත්තවුන් තමා හැර යන අයුරු වේදනාබර දෑසින් තමන්ගේ දේශ සීමාවේ සිට ඉවසීමෙන් මැදිහත්ව ඔහේ බලා සිටිය හැක. එසේ නොවේ නම්, යන්න ගියවුන්ට ඔවුනගේ හිත් වෙනස් කොට යළි හැරී විත් ඒ දොරින්ම පුරුදු පැරණි කුටියටම ඇතුළු විය හැක. එහෙමත් නැත්නම්, ඔවුන් වෙනත් කෙනෙකුන් වෙනුවෙන් ඇත්තම ආදරයක් හිතේ රුවා ගෙන නික්ම ගියේ නම්, යළි නොහැරී දිගටම පිය මැන ගොස් ඒ අය මුණගැසී අලුත් ජීවිතයක් අලුත් සීමා මායිමක ඔහු සිතූ පරිද්දෙන්ම ඇරඹිය හැක. ඒ නයින් නික්මයාමක් යනු සියල්ලම සුණු විසුණු වී ගිය නිමේශයක් ලෙස ගෙන සියලු දොර කවුළු වසා දමනු හෝ වසා හිඳිනු වෙනුවට, ජීවිතයේ ඊළඟට ලියැවෙන්නට නියමිත දේ ගැන වඩාත් සවිඥානකව බැලීමට උත්තේජනයක් සපයන්නටත් කෙනෙකුගේ අහිමිවීම තව කෙනෙකගේ හිමිවීම ලෙස උපේක්ෂා සහගතව බලන්නටත් ඒ ඔස්සේ කිසියම් ජීවිතාබෝධයක් ලබා දෙන්නටත් මේ කවියට හැකි වී ඇත්තේ ඒ අයුරිනි.

කවියේ ඊළඟ කොටස්වලට ඇදෙන විට ඈ ටිකෙන් ටික හිත හදා ගනිමින් සිටින බවක් ඇගේ නිවුණු ස්වරයෙන් පැහැදිලි වේ. ඈ යන්න ගිය කෙනාගෙන් කිසිදු ද්වේශයක් තරහක් නොමැතිව අසන්නේ ඒ ඉවුරු කෙබඳුද කියාය? එනම් ඔහුගේ අලුත් පෙම්වතිය හෝ සහකාරිය කෙසේද, ඔහුට ගැළපෙනවාද කියාය; තමා නදියක් නම්, ඒ නදිය වාගේම ඔහුට හමුවූ අලුත් ඉවුරුත් කලබලකාරීද කියාය? එනම් මෙහි හුවා දක්වන කාන්තා චරිතය ඉතාම චංචල කලබලකාරී බවක් උසුලන තැනැත්තියක් බව ගම්‍ය කරන්නට රචිකාව උත්සාහ ගන්නා අතර ඈ සිත පැන නැගුණු කුහුළ වන්නේ ඒ අලුත්

**46 පිටට**